04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදයකින් අවම වශයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගත් හා අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි (*සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද හිමි නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද පිටපත සහතික කර ඉදිරිපත් කළ යුතුයි)

04.4 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අපේක්ෂකයා විසින් සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

### 05.1 පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම

**විභාග අංක - I**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් භාෂාව (දෙමළ / සිංහල), ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) **එකවර** සමත්වී තිබිය යුතුයි.

**හා**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයක් සමත් වී තිබිය යුතුයි. (පොදු පරීක්ෂණය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

01. ඇඟළුම් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක පාඨමාලා පරීක්ෂණයෙන් විවීමේ ගිණුම්කරණය විෂයට සම්මාන සමාර්ථය සමඟ සහතිකයක් හිමි කර තිබිය යුතුයි.

**හෝ**

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q Level) සහතික 02 / 03 - පේෂකර්ම / ඇඟළුම් කර්මාන්තය

02. බඳවා ගන්නා අවස්ථාවේදී මෙම තනතුර සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩියෙන් දක්නට ලැබේ නම් බඳවා ගැනීමේ අරමුණ උදෙසා පහත සඳහන් පේෂ කර්ම සම්බන්ධ සහතික ද සැලකිල්ලට ගනු ලැබේ.

(i) රජයේ ලලිතකලා ආයතනයෙන් ප්‍රදානය කරන ලද උසස් ශ්‍රේණියේ සහතිකයක්.

(ii) වානිජ පේෂකර්ම ආයතනය විසින් / කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රදානය කළ සහතිකයක්.

(iii) විවීම් මධ්‍යස්ථානයකින් වසරක විවීම්කරුවකු වශයෙන් සේවය කළ අත්දැකීම් ඇති බවට කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතියක්.

**(ඉ) වයස්සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **18 නොඅඩු, හා වයස අවුරුදු 40 නොවැඩි** විය යුතුයි.

### 05.2 පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට සීමිත තරග විභාගය මගින් බඳවා ගැනීම

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගනකදී** අවම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සමාර්ථයන් සමඟ විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

විවීම් ගිණුම්කරණය සම්බන්ධයෙන් ඇඟළුම් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වසරක පුහුණු පාඨමාලාවෙ අවසන් පරීක්ෂණයෙන් සම්මාන සාමාර්ථය සමඟ සහතිකයක් හිමි කර තිබිය යුතුයි.

